**පෝරතිවු පත්තු ප්‍රාදේශීය සභාව**
**මඩකලපුව දිස්ත්‍රික්කය**
**-----------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
**-----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**--------------------------------**

2016 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 31 දින ද පසුගිය වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 22 දින ද විගණනයට ඉදිරිපත් කර තිබුණි. 2016 වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 ඔක්තෝබර් 12 දින සභාවේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
**------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට පෝරතිවු පත්තු ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයන් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
**-------------------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
**----------------------------**

පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(අ) සභාව විසින් පවත්වාගෙන යනු ලැබූ තැන්පත් ලෙජරය අනුව 2016 දෙසැම්බර් 31 දිනට ආපසු ගෙවිය යුතු තැන්පතු රු.7,795,808 ක් වුවත් ශේෂ පත්‍රයේ රු.4,085,978 ක් වශයෙන් දක්වා තිබීම හේතුවෙන් ආපසු ගෙවිය යුතු තැන්පතු රු.3,709,830 ක් වශයෙන් අඩුවෙන් පෙන්වා තිබුණි.

(ආ) පළාත් සභාවට වෙන්කරන ලද සංවර්ධන ආධාරවලින් ලැබී තිබුණු රු.2,192,749 ක ආධාර ජංගම බැරකම් යටතේ දක්වා තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය
**---------------------**

### 2.1 මූල්‍ය ප්‍රතිඵල
**---------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් ඉක්ම වූ ආදායම රු.536,986 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු. 2,565,666 ක් විය.

.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) 2008 වර්ෂයේ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් ප්‍රාදේශීය සභාවට පරිත්‍යාග වශයෙන් ලබා දී තිබූ තලන යන්ත්‍රයේ (Hand Roller) රෝදය (Wheel) ක්‍රියා නොකිරීම හේතුවෙන් 2012 වර්ෂයේ සිට භාවිතයෙන් තොරව සභා පරිශ්‍රයේ නවතා තිබූ නමුත්, ඒවා අලුත්වැඩියා කොට නැවත භාවිතා කිරීමට හෝ වෙන්දේසි මඟින් විකිණීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ආ) පොදු අරමුදල් ඵලදායීව භාවිතා කිරීමේ අරමුණෙන් පළාත් සභා සංවර්ධන වැඩසටහන් වෙනුවෙන් වෙන් කරනු ලබන අරමුදල් යටතේ ක්‍රියාත්මක කරනු ලබන කර්මාන්ත සඳහා දිගු කාලයක් ගතවන කාපට් දැමීම, කොන්ක්‍රීට් දැමීම හා තාර දැමීම් හැර බොරළු දැමීම් ආදි තාවකාලික මාර්ග ඉදිකිරීමේ කටයුතු සිදු නොකළ යුතු බවට 2015 දෙසැම්බර් 30 දිනැති අංක 2016/01 දරන මුදල් කොමිෂන් සභා චක්‍රලේඛයේ සඳහන් කර තිබුණත්, ඒ පිළිබඳව සැලකිල්ල යොමු නොකොට සමාලෝචිත වර්ෂයේ සභාව විසින් මාර්ග 08 කට රු.1,037,812 ක වියදමින් බොරළු දමා තිබුණි.

## 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

## 4.1 නිරවුල් නොකළ විගණන ඡේද

සභාව සම්බන්ධයෙන් විගණකාධිපති වාර්තාවල ඇතුළත් කරනු ලැබූ විගණන ඡේදවලින් අනාවරණය කරනු ලැබූ ඌනතා සහ අඩුපාඩු සම්බන්ධයෙන් සභාව මේ දක්වා නිවැරදි කර නොතිබූ විගණන ඡේදවලට යොමුව පහත දැක්වේ.

| වාර්තාවට යොමුව | | ඇතුළත් විෂයය |
|---|---|---|
| වර්ෂය | ඡේද අංකය | |
| 2015 | 2.2.2(ආ) | 1990 වර්ෂයේදී විනාශ කළ ගොඩනැගිලි, ගෘහ භාණ්ඩ ආදියෙහි පිරිවැය ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබීම. |
| 2015 | 3.2.1 | දේපළ මත වරිපනම් බදු අයකිරීමට කටයුතු නොකිරීම. |
| 2015 | 4.1 | ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 09 දෙනෙකුගෙන් අයකර ගත යුතු රු.506,576 ක හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු නොකිරීම. |

## 4.2 පද්ධති හා පාලන

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

| පාලන ක්ෂේත්‍රය | විශේෂ අවධානය යොමු කළ යුතු විෂයයන් |
|---|---|
| (අ) ගිණුම්කරණය | තැන්පත් ලෙජරය යාවත්කාලීනව පවත්වා ගැනීම. |
| (ආ) ආදායම් කළමනාකරණය | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කිරීම. |